

# පුංචි චිත්‍රය

ඒ.ජේ.එම්. ඔනිති සියන්සා අබේකෝන්

# පුංචි වීරවරිය

## ඒ.ජේ.එම්. ඔනිති සියන්සා අබේකෝන්
කතෘ

**කතෘගේ වෙනත් කෘති**

මැඩිසා කුමරිය
අපූරු යාලුවෝ

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර
6- B ශ්‍රේණිය

ISBN : 978-624-211-203-9

10.05.2026

# පිදුම

කන්ද උඩරට සෙංකඩගල පුර
ශ්‍රී දළදා සමිඳු අභියස රැදෙන....
මහාමායා බාලිකා විදු පියසේ
සිප් සතර හදාරන මා...

මාගේ ආදරණීය දෙමව්පියන් සහ
සිප්තර ලබාදෙන මගේ ආදරණීය
ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ට,
මාගේ ආදරණීය සහෝදරියන්ට
මෙම පොත පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10




ප්‍රංශය කියන්නේ හරි ම අපූරු
වගේම හරි ලස්සන රටක්. ඒ රටේ
එක් කෙළවරක ධනවත් නගරයක්
තිබුනා



එහෙ සරුවට පළතුරු එළවළු
වැවෙන ප්‍රදේශයක්




හැබැයි ඒ පැත්තේ හිටපු මිනිස්සුන්ගේ අයහපත් ගතිගුණවල නම් කිසිම අඩුවක් නෑ. එයාලා එකිනෙකාට ඊර්ෂයා කරා කිසිම හේතුවක් නැති ව සල්ලි බලයට රණ්ඩු කර ගත්තා.



එක දවසක් ඒ ප්‍රදේශයට තවත්
හරි ම දුප්පත් පවුලක් එකතු වුණා.
එයාලා නම් හරි කරුණාවන්ත
යහපත් මිනිස්සු. ඒ පවුලේ හිටියේ
දුවයි, තාත්තයි විතරයි.
එයාලගේ අම්මා මිය ගිහිල්ලා.



එයාලා ප්‍රදේශයේ කොණක තිබ්බ
පරණ ගෙයක් මිලදී ගත්තා




එයා ටික දවසක් යද්දී ඒ ප්‍රදේශයේ
තිබුනු පාසලට ඇතුළු වුණා.එයා
හරි හරියට ඉගෙන ගත්තා.



ඒ හින්ද ම අනිත් ධනවත් ළමයිනුත්
එයාලගේ දෙමාව්පියේ මේ පුංචි
ළමයට ඊර්ෂයා කරන්න පටන් ගත්තා.
මේ පුංචි ළමයට යාළුවෙක් වත්
හිටියේ නෑ. හැමෝම එයා දුප්පත්
නිසා උසුළු විසුළු කරා.




මේ පුංචි ගැනු ළමයා සෙල්ලම් බඩු
දිහා බල බලා සතුටු වුණා.
කවදාවත් ඒවා ඉල්ලලා තාත්තා එක්ක
රණ්ඩු කළේ නෑ. මොකද එයා දැනගෙන
හිටියා එයාලට එතරම් සල්ලි
නෑ කියලා




ඔහොම දවස් හරි ඉක්මනට ගෙවිලා ගියා. මේ පුංචි ගැනු ළමයා හොඳට ඉගෙන ගෙන ලස්සන ධනවත් තරුණියක් බවට පත් වුණා. එයා කවදාවත් යහපත් ගතිගුණ අතහැරියේ නෑ. ඒ වගේ ම එයා තමන්ගේ තාත්තා ට හොඳට බලා ගත්තා. එයා වෙනත් ධනවත් නගරයකට පදිංචියට ගියා.




වෛද්‍යවරියක් උන එයාට දැන ගන්න හම්බවුණා. තවත් පුංචි කාලෙ හිටපු ප්‍රදේශයේ වසංගතයක් බෝ වෙලා කියලා එයා ඉක්මනට තවත් සේවකයින් සමඟ එහෙට ගිහිල්ලා තමන් පුංචි කාලෙ තමන්ට රිද්දපු මිනිසුන්න පවා ප්‍රතිකාර කළෙ එයාගේ කරැණාවන්ත බවත් පෙනවමින්.

ඉතින් යාළුවනේ දැක්කා නේද මේ
පුංචි ළමයා, මේ මට ඊර්ෂ්‍යා කරපු නරක
මිනිස්සුන්ට මං ප්‍රතිකාර කරන්නේ ඇයි ?
කියලා හිතලා එදා ප්‍රතිකාර නොකලා
ඒ ප්‍රදේශයට කොච්චර ලොකු
වසංගතයක් වෙන්න තිබුණද කියලා.

නිමි.

අපිත් කොච්චර දුෂ්කරතා තිබුණත්
ඇති ඇති දෙයින් සතුටු වෙලා
අපේ අනාගත බලාපොරොත්තුව
ඉටු කරගමු.
හැමෝ ම කරුණාව දක්වමු.
එතකොට මේ ලොකේ මීට වඩා
ලස්සන වේ.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN** අංකය : **978-624-211-203-9**